සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 07 | විෂයය / பாடம் / Subject : භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper : I,II | කාලය / காலம் / Time : පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:

* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

* II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I පත්‍රය

❖ අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර්
(1) මිලියන 510කි. (2) මිලියන 500කි.
(3) මිලියන 12757 කි. (4) මිලියන 360කි.

(02) ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) උතුරු අක්ෂාංශ $79^0$ - $82^0$ අතර ද නැගෙනහිර දේශාංශ $5^0$ - $10^0$ අතර ද වේ.
(2) උතුරු අක්ෂාංශ $5^0$ - $10^0$ අතර ද නැගෙනහිර දේශාංශ $79^0$ - $82^0$ අතර ද වේ.
(3) උතුරු අක්ෂාංශ $55^0$ - $96^0$ අතර ද නැගෙනහිර දේශාංශ $79^0$ - $82^0$ අතර ද වේ.
(4) උතුරු අක්ෂාංශ $79^0$ - $82^0$ අතර ද නැගෙනහිර දේශාංශ $55^0$ - $96^0$ අතර ද වේ.

(03) මුහුදු මට්ටමේ සිට 300m ට වඩා උසින් යුක්ත බිම්වල දැකගත හැක්කේ කුමන භූ දර්ශනයක් ද?
(1) වෙරළබඩ භූ දර්ශනය (2) අඩතැනි කලාපීය භූ දර්ශනය
(3) වෙරළබඩ හා අඩතැනි කලාපීය භූ දර්ශනය (4) කඳුකර භූ දර්ශනය

(04) යම් ප්‍රදේශයකට නිශ්චිත කාලවකවානුවක් තුළ ලැබිය යුතු සාමාන්‍ය වර්ෂාපතනය නොලැබී යාම නිසා පරිසරයේ ඇති වන වියළි ස්වභාවය,
(1) ගංවතුර ලෙස හැඳින්වේ. (2) නායයාම් ලෙස හැඳින්වේ.
(3) නියඟය ලෙස හැඳින්වේ. (4) සුනාමි උපද්‍රවය ලෙස හැඳින්වේ.

(05) විශාලත්වය අනුව ලොව කුඩා ම මහාද්වීපය වන්නේ,
(1) ආසියා මහාද්වීපය (2) අප්‍රිකා මහාද්වීපය
(3) යුරෝපා මහාද්වීපය (4) ඕස්ට්‍රේලියා මහාද්වීපය

❖ අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

(යාබද මුහුදු සීමාව, දිශාව, රාජ්‍යීය මුහුදු සීමාව, 25%, වර්ෂණය, 71%, වියළි කලාපීය, අකුණු, තෙත් කලාපීය)

(06) පෘථිවි පෘෂ්ඨයෙන් ..........................ක් ජලයෙන් ද 29%ක් ගොඩබිම් ප්‍රදේශවලින් ද වැසී ඇත.

(07) අන්තර් ජාතික සාගර නීතියට අනුව ලෝකයේ සෑම වෙරළබඩ රාජ්‍යයකටම වෙරළ මායිමේ සිට නාවික සැතපුම් 12 සීමාවක අයිතිය උරුම කරදෙන ලදි. එය ......................... ලෙස හැඳින්වේ.

(08) ශ්‍රී ලංකාවේ නිරිත හා බටහිර ප්‍රදේශ, මධ්‍යම කඳුකරයේ බටහිර ප්‍රදේශවල .............................. භූ දර්ශනයක් දැකිය හැකි ය.

(09) වළාකුලක් තුළ ඇති විය හැකි විද්‍යුත් ක්‍රියාකාරීත්වය මත ප්‍රතිවිරුද්ධ ආරෝපන දෙකක් අතර සිදුවන විදුලිය මුදා හැරීම ........................... ලෙස හැඳින්වේ.

(10) සිතියමක් කියවීම සඳහා ......................... ද අත්‍යවශ්‍ය වේ.

❖ **අංක 11 - 15 දක්වා ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(11) පෘථිවිය, ගෝලාකාර වස්තුවක් ලෙස සැලකුව ද එය පූර්ණ ගෝලයක් නොවේ. ( )

(12) ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත ප්‍රදේශයක සිට රට තුළට ගමන් කරන සංචාරකයකුට භූ විෂමතාව, දේශගුණය හා වන වැස්මේ විවිධත්වය දැකගත නොහැකි ය. ( )

(13) ශ්‍රී ලංකාවේ වර්තමාන ශිෂ්ටාචාරයට ආවේනික වූ ලක්ෂණ අතීතයේ වියළි කලාපීය භූ දර්ශනයේ මානුෂ සලකුණයි. ( )

(14) ශ්‍රී ලංකාවේ නායයෑම්වලට ලක්වන දිස්ත්‍රික්කයක් ලෙස රත්නපුරය හැඳින්විය හැකි ය. ( )

(15) සිතියමක් පිටලස් කිරීම මගින් රටක සීමාව නිවැරදිව පිටපත් කිරීමට හැකිවේ. ( )

❖ **අංක 16 - 20 දක්වා රූප රාමුවලට ගැළපෙන විස්තරයට අදාළ අක්ෂරය ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.**


A. ග්‍රිනිච් රේඛාව B. කඩොලාන ශාක C. ආපදාවන්


D. කඳුකර ප්‍රදේශවල උසින් අඩු ශාක E. සිතියමක දිශාව දැක්වීම

(16) 

(17) 

(18) 

(19) 


(20) 


(ලකුණු 2 x 20 = 40

## II පත්‍රය

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

* අනිකුත් ප්‍රශ්න අතුරින් හතරකට පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.


(01) (i) කර්කටක නිවර්තනයේ අක්ෂාංශ අගය නිවැරදිව ලියන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ ප්‍රධාන සාගර සංඛ්‍යාව කොපමණ ද? (ලකුණු 02)

(iii) අක්ෂාංශයක් යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? (ලකුණු 02)

(iv) මහාද්වීපයක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(v) ලෝක සිතියම නිරීක්ෂණය කර පිළිතුරු සපයන්න.




පහත සඳහන් ස්ථාන සිතියමේ දැක්වෙන අක්ෂර අතරින් තෝරා පිළිවෙලින් ලියන්න.

(1) කැස්පියන් මුහුද දැක්වෙන අක්ෂරය

(2) අප්‍රිකා මහාද්වීපය දැක්වෙන අක්ෂරය

(3) ඉන්දියන් සාගරය දැක්වෙන අක්ෂරය

(4) මැඩගස්කරය දූපත දැක්වෙන අක්ෂරය (ලකුණු 08)

(02) (i) ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයට අයත් භූ විෂමතා ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ වර්ෂාව ලැබෙන ක්‍රම දෙකක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) ශ්‍රී ලංකාවේ කඳුකර භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 02)

(ii) වියළි කලාපීය භූ දර්ශනයේ විශේෂ ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) වෙරළාශ්‍රිත භූ දර්ශනයේ පදනම් කරගෙන ගොඩනැගුණු මානුෂ ක්‍රියාකාරකම් පහක් ලියන්න. (ලකුණු 05)

(04) (i) නියඟ ඇතිවීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) නියඟය නිසා මිනිසාට ඇතිවන බලපෑම් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) නියඟය නිසා පරිසරයට ඇතිවන බලපෑම් දෙකක් සඳහන් කර ඉන් එක් කරුණක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) සිතියමක මූලිකාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සිතියමක් පිටලස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) සිතියමක් පිටලස් කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) සංස්කෘතික උරුම බෙදා දක්වන ප්‍රධාන අංග දෙක මොනවා ද? (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ස්වාභාවික නිර්මිත හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය උසස් මට්ටමක පැවතීම කෙරෙහි බලපාන සාධක පහක් ලියන්න. (ලකුණු 05)

(07) (i) දේශගුණික වෙනස්වීම් ඇතිවීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) දේශගුණික වෙනස්වීම් ශ්‍රී ලංකාවට අහිතකර ලෙස බලපාන ආකාර හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) දේශගුණික වෙනස්වීම් අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ලකුණු 05)